# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1397 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | திகதி<br>දිනය<br>Date | 07/11/2023<br>පැය 1710 |

# මාධ්‍ය නිවේදනය

## 01. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය මීගමුව.

2023.11.06 වන දින දහවල් කාලයේ කොටදෙනියාව පොලිස් වසමේ දික්ලන්ද ප්‍රදේශයේදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා ලීටර් 945 ක් (බැරල් 05 ක්)** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කොටදෙනියාව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන මැල්ලවගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටදෙනියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - වැලිකන්ද පොලිස් වසම.

2023.11.07 වන දින දහවල් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ මෛත්‍රීගම ඩී ඇළෙහි නාඳුනන පුද්ගලයෙකු මෘත ශරීරයක් දියේ පාවෙමින් තිබෙන බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ පමණ වන සුදු පැහැති දිගු අත් සහිත කමිසයක් හැඳ සිටින අතර අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

වැලිකන්ද පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මිය යාම - පේරාදෙණිය පොලිස් වසම.

2023.11.06 වන දින දහවල් කාලයේදී මහනුවර සිට රඹුක්කන දක්වා ධාවනය වූ දුම්රියක නානුඔය සහ පිළිමතලාව දුම්රිය ස්ථාන අතර දී පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදු වී ඇති බවට පේරාදෙණිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන එරමුදුලියැද්ද, හතරලියද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හදිසි මරණ පරීතක්ෂණ හා පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඇති අතර මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පේරාදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි

## 04. මාරක රිය අනතුරක් - පොල්ගහවෙල පොලිස් වසම.

2023.11.06 වන දින රාත්‍රී කාලයේ පොල්ගහවෙල පොලිස් වසමේ කොළඹ කුරුණෑගල මාර්ගයේ කහවත්තේ ඇල අසලදී කුරුණෑගල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනිමට නොහැකිව ඉදිරියෙන් පැමිණි පාපැදියක ගැටී විසි වී ගොස් කාණුවකට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් දෙදෙනාම තුවාල ලබා පොල්ගහවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ පොතුහැර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පොල්ගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**